
1

## 1.2 විශේෂාංග රූප සටහන්
## විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම

පිරිවැයට වඩා අඩු අගයකින් මිල නියම කිරීම මගින් විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම පිළිබඳව නොසලකා සැමට එක ලෙස සලකා විවෘත ලෙස සහනාධාර ලබා දීමේ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම සහනාධාර, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ ද්‍රවශීලතා හිඟයන් බැංකු අංශය විසින් මූල්‍යකරණය කරන ලද අතර, එමගින් අනෙකුත් ඵලදායී ආයෝජන සීමා විය. 2022 වසරේ දී, මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි මූල්‍යමය ශක්‍යතාව සුරක්ෂිත කිරීම සඳහා එම ආයතනයන්හි දිගු කාලීන ණයවලින් කොටසක් රජය වෙත පවරා ගැනීමට සිදු වූ අතර, පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයකට අනුකූලව, 2022 සහ 2023 වසරවල දී ඉන්ධන මිල ගණන් සහ විදුලිය ගාස්තුවල සැලකිය යුතු සංශෝධන කිරීමට සිදු විය. ඉන් පසුව, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං. යන ආයතන දෙකම වාර්ෂිකව ලාභ ලබමින් ඇත. උපයෝගිතා සඳහා වන සහනාධාර මගින් මහජනතාවට සහ ව්‍යාපාරවලට කෙටි කාලීන සහනයක් ලැබුණ ද, අවසානයේ දී, එහි දිගුකාලීන පිරිවැය, ඉහළ බලශක්ති මිල ගණන්, බදු සහ සමස්ත උද්ධමනයේ ඉහළ යෑම හරහා දරා ගැනීමට ඔවුන් හට සිදු වන බව ඉහත අත්දැකීම මගින් අනාවරණය වේ. කෙටි කාලීන වාසි වෙනුවෙන් සාර්ව ආර්ථිකයට දිගු කාලීන අයහපත් බලපෑම් ඇති වන අයුරින් පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කිරීමේ විෂම චක්‍රය වැළැක්වීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන ආකාරයේ මිල නියම කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන ආකාරයේ මිල නියම කිරීමේ ක්‍රමවේදයෙන් අපගමනය වීම, රජය හෝ ව්‍යාපාර හෝ මහජනතාව සඳහා දිගු කාලීනව වාසිදායක නොවේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිඹිඹු නොවන ආකාරයෙන් මිල නියම කිරීම තුළින් සැමට විවෘත ලෙස සහන ලබා දීම වැනි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට වෙනුවට, ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම හරහා, ආර්ථිකයේ අවශ්‍යතා ඇති ජන කොටස්වලට අමතර සහන සැපයිය හැකිය. තවද, නිෂ්පාදන පිරිවැය අඩු කරන අතරතුර මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තරගකාරීත්වය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම තුළින් පාරිභෝගිකයාට ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියාමාර්ග ගත හැකිය.

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය (වාර්ෂික ලාභය/අලාභය)**




මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව